# “ගායනා” කවයෙන්

# ජන ගී මියැසිය







රටක ජනතාව තුළින් බිහි වී ජනතාව තුළින් ම ප්‍රවර්ධනය වී ජනතාව අතරම පවතින කලාවන් ජන කලා නම් වෙයි. මේ නිසාම මේ කලාවන්ට හිමිකරුවන් නො මැතියි. වෙනත් අන්දමකින් කිවහොත් කතෘ අඥාතයි.

අපගේ මව් බිමේ ජන කලා අතර ජන කවි, ජන ගී සහ ජන සංගීතය එකිනෙකට බැඳී පවතියි. මේ කලාවන් පිළිබඳව උනන්දු වී මහත් කැපවීමකින් යුතුව ඒවා මතු පරපුර වෙනුවෙන් ස්ථාපිත කිරීමට පුරෝගාමී වූයේ ඩබ්ලිව්. බී. මකුලොළුව සහ සී. ද ඇස්. කුලතිලක සූධීන් දෙපළයි. භාරතයෙන් උත්ර භරතීස රාගධාරී සංගීතය හදාරා මව් බිමට පැමිණිය ද ජන ගීය මූලික කොටගත් අපේ ම සංගීතයක් වෙනුවෙන් මේ දෙපළගෙන් සිදු වූ මෙහෙවර පණ්ඩිත් අමරදේවයන් මුල් කොටගත් ගායන හා නිර්මාණ කරුවන්ට අගනා තෝතැන්නක් විය.

ගමින් ගමට ගොස් ජන ගී පටිගත කරගනිමින් ඒවා ස්වර ප්‍රස්ථාර කොට ග්‍රන්ථාරූඪ කිරීමෙහිලා පුරෝගාමියා වූයේ ඩබ්ලිව්. බී. මකුලොළුව සංගීතවේදියාණන්ය. එහි අගනා ඵලයකි “හෙළ ගී මග” ග්‍රන්ථය. ජන සංගීතය අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දුන්නේත් එතුමායි. “පහන”, “දෙපානෝ” වැනි ජන සංගීත සන්ධ්වනි තුළින් ජන ගී කලාව ජනගත කිරීමෙහි ලා එතුමන් ගත් වෙහෙස සැබවින් ම අභියෝගාත්මක යි. වසර 1922 පෙබරවාරි 17 දා මහනුවර හාරිස්පත්තුවේසී උපන් මකුලොළුව මහත්මා, ගමේ පාසල් අධ්‍යාපනයෙන් පසු කටුගස්තොට ශ්‍රී රාහුල විද්‍යාලයේදීත් කොළඹ ආනන්ද විද්‍යාලයේදීත් ද්විතීක පාසැල් අධ්‍යාපනය ලැබීය. 1944 දී විශ්ව භාරතී විශ්ව විද්‍යාලයට ඇතුලත්ව සංගීත ඩිප්ලෝමා උපාධිය ලබා 1949 දී කථිකාචාර්ය ධූරයට පත්වීමට එතුමාට හැකි-විය. භාරත දිවිය අවසන් කොට මව්බිමට සපැමිණි එතුමා 1953 අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සංගීත පරීක්ෂක තනතුරකින් සිට වෘත්තීය මව් බිමේදී ඇරඹීය. 1982 විශ්‍රාම ලබනා විට එතුමා සංස්කෘතික අමාත්‍යංශයේ කලා හා නිර්මාණ අධ්‍යක්ෂක ධූරය දැරීය. 1984 සැප්තැම්බර් මස 08 දා එතුමා මෙලොවින් සදහටම වෙන්විය. (මානවංශ සංගීත විමර්ශන)

ශ්‍රී ලාංකේය සංගීත අධ්‍යාපන ක්ෂේත්‍රයට මානව වංශ සංගීත විද්‍යාව හඳුන්වා දුන් පුරෝගාමී ශ්‍රේෂ්ඨ පර්යේෂකයා වන්නේ සී. ද එස්. කුලතිලක මහතාය. මකුලොළුව මහත්මාගේ පුරෝගාමී සේවාව සම්පූර්ණ කරමින් ජන සංගීතය පිළිබඳව පර්යේෂණ කටයුතු සඳහා සිය කාලය, ශ්‍රමය, ධනය කැප කළ එතුමා සියළු දෑ සංරක්ෂණය කරමින් ද සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් ලිපි, ග්‍රන්ථ සහ දේශන මගින් ජනතාව දැනුවත් කරමින් ද, විදෙස් සංචාරයන්හි යෙදෙමින් මේ කලාව ප්‍රචලිත කරමින්ද කළ සේවය අමිල වේ.

1926 දෙසැම්බර් 14 දින අම්බලන්ගොඩ පොල්වත්ත ග්‍රාමයේ ඉපදුන සී. ද එස්. කුලතිලකයන් එහි බෞද්ධ පිරිමි පාසලෙන් සහ ධර්මාශෝක විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලැබීය. 1948 දී තෙල්දෙණිය මහා විද්‍යාලයේ ඉංග්‍රීසි ගුරුවරයෙකු ලෙසින් ඇරඹූ සිය වෘත්තීය ජීවිතය මහරගම හා මීරිගම ගුරු විද්‍යාලවල සංගීත උපදේශක හා කථිකාරචාර්ය තනතුරු, ගුවන් විදුලියේ අංශ ප්‍රධාන තනතුර කලා මණ්ඩලයේ සංගීත අනුමණ්ඩලයේ සභාපති තනතුර, සෞන්දර්යය අධ්‍යන අංශයේ පර්යේෂණ නිළධාරී හා කථිකාරචාර්ය තනතුරු දක්වා විහිදුවාලීමට එතුමා සමත් විය. එතුමා 2005 මැයි 21 වනදා අපගෙන් සමුගත්තේය. (මානවවංශ සංගීත විමර්ශන)

මේ පුරෝගාමීන් දෙපළ සිහිපත් කරමින් මෙල්බන් නුවර “ගායනා” කවය මැයි 12 දින පැවැත්වීමට සංවිධානය වන “ජන ගී මියැසිය” ප්‍රසංගයේ ආරාධිතයා ලෙසින් රෝහණ බැද්දගේ මානව සංගීත වේදියානන් සහභාගී වීමට නියමිතයි. මකුලොළුව සහ කුලතිලක සූධීන්ගේ එකී මහඟු මෙහෙවර ඉදිරියටත් කරගෙන යාමට ඉදිරිපත් වූ ඔවුනගේ අනුගාමිකයින් අතර රෝහණ බැද්දගේ සහ ලයනල් රන්වල මානව සංගීත වේදීන්ට හිමිවන්නේ කිසිවකුට නොදෙවෙනි තැනක්. බන්දුල විජේවීරයන් සමඟ බැද්දගේ කලාකරුවාණන් එක් ආකාරයකටත්, සහන් රන්වල ප්‍රමුඛ ලයනල් රන්වල පදනම සමඟ රන්වලයන් තවත් ආකාරයකටත් මේ සද්කාර්යයට උරදුන්නා. මෙල්බන් දරුවන්ගේ ජන ගී ගායනා කුසලතා අගයමින් මකුලොළුව සහ කුලතිලක සූධීන් නමින් තිලිණ ප්‍රධානයක්ද ප්‍රසංගයට ඇතුළත් වෙයි.

“ජන ගී මියැසිය” ඉදිරිපත් කරනා “ගායනා” කවයේ උපදේශක වරයා වන තරුපති මුණසිංහ තරුණ සංගීත වේදියාණන්ගේ අදහස් දැන ගැනීම සඳහා අපි උනන්දු වූයෙමු.

“මුලින් ම ගායනා සංගීත කවය” ගැන වචනයක් කියන්න කැමතියි. අපි මේ කවය පටන් ගත්තේ 2008 දී. මේ රටේ තනිවෙලා ඉන්න වැඩිහිටි සංක්‍රමණිකයින් මව්බිමේ යම් යම් දේවල්වලින් ඈත්වෙලයි ඉන්නේ. සගීතය ඉගෙන ගන්න අයගේ ලොකු බලාපොරොත්තු නෑ. තමන්ගේ මඟ හැරෙන දේ තමන්ගේ සතුට වෙනුවෙන් ලංකර ගන්නයි ඔවුන්ට ඕන කළේ. ඒ නිසා කවයට පිරිස ගන්න කොට මම තෝරා ගැනීමක් කලේ නෑ.

“2010 දී හඳුනා ගත්තොත් ඔබ මා” පසංගය කළේ බොහොම විවෘත විදියකින් බලලා. සිනමා ගී, සරළ ගී ප්‍රසංගයේ ඉදිරිපත් වුනා. 2012 දී “ සෝබාව දේ ” ප්‍රසංගය කළේ වේදිකා නාට්‍ය ගී එකතුවක් විදියට. වේදිකාවේ හැසිරෙන විදිය, වේදිකාවට තියෙන බය නැති නම් සබකෝලය නැතිකරගැනීමේ අරමුණින් කරපු ඒ ප්‍රසංගය ප්‍රේක්ෂකයින්ට වෙනම අත්දැකීමක් වුනා. 2014 දී සුනිල් ශාන්තයන්ගේ ගීත එකතුවක් විදියටයි “ කෝකිල නාදේ ” ප්‍රසංගය කළේ. ඒ ගීවල රසය හඳුනාගෙන ඒ ගායන විලාශයට පුහුණු කරවීමයි මගේ අවශ්‍යතාවය වුනේ. 2016 දී අපි “ගායනා සිතුවම්” කියලා ස්වතන්ත්‍ර නිර්මාණ ඇතුලත් සංගත තැටියක් එලී දැක්වූවා. ඒවා කතුවේ නිර්මාණ තමයි ප්‍රසංගයේ ගැයුවේ. මේ ප්‍රසංග හරහා කුසලතා එළිදැක්වීමත්, ඉගෙන ගන්න දේ ප්‍රායෝගියකව අත් විඳීමත් ගායනා කවයේ අරමුණු වුනා. ඒ ගායනා සංගීත කවයේ අතීත මං සළකුණු 2018 මැයි මාසයේ පැවැත්වෙන “ ජන ගී මියැසිය” පිළිබඳව තරුපති මුණසිංහයන් සිය අදහස් දක්වමින්

“ජන ගීයක් ගැයීමේදී සැළකිලිමත් විය යුතු කාරණා වගේම හඬ පාලනය අවබෝධ කරගන්න ඕන. ඒ හැඟීම් ඇති කරවමින් ඒ ස්වරයෙන් ගැයීම වැදගත්. ඉතින් ඒ වෙනස හඳුන්වා දීමටයි මට අවශ්‍ය කළේ.”

“අවුරුදු හතක පමණ කාලයක් මෙල්බන්වල ඉගෙන ගනිමින් ඒ ජීවිතය විඳපු කෙනෙක් හැටියට කියන්න ඕන කාරණයක් තියෙනවා. පහුගිය කාලය ඇතුලත සංගීත ප්‍රසංගවල විශාල වෙනසක් ඇතිවෙලා තියෙනවා. මෙල්බන් ප්‍රජාව ඇතුලත අයට ඒ ප්‍රසංගවලින් මොනවද දැන් වෙන්නේ ?. දැං මේ පත්තර, මාධ්‍ය කරන්නේ ස්වයං සේවාවන්. තමන්ගේ අයට තියෙන ඇල්ම නිසා. ඒත් දැන් තමන්ගේ කෙනෙක් මගදි දැක්කත් කතා කරන්නේ මොනවා හරි වෙළඳාමක් කරගන්න. තමන්ගේ කමට සලකන පුරුද්ද නැති වෙලා. ප්‍රායෝගික භාවිතාවක් හැටියට තමන්ගේ අයට ගරු කරන්න, ඒ අයට සාධාරණයක් කරන එකයි අපේ යුතු කම වෙන්නේ.”

---

ප්‍රසංගය වෙතට නැවතත් යොමු වෙමින් තරුපති මුණසිංහයන් ;

රෝහණ බැද්දගේ කියන්නේ මානව සංගීත වේදියෙක් හැටියට මම දකින්නේ. ගැමියන් අතරේ ඉන්න ගැමි දිවිය ගැන හොඳින් දන්න සංගීත වේදියෙක්. එතුමා හොඳ ගැමියෙක් වගේම හොඳ ගායන ශිල්පියෙක්. හොඳ රංගන ශිල්පියෙක්, ඒ වගේම හොඳ සංගීත අධ්‍යක්ෂවරයෙක්. ඉතින් මේ ප්‍රසංගය මෙහෙයවන්නේ එතුමා ජන ගී ගයමින්, විස්තර කරමින් අගේට මේ වගකීම එතුමා ඉෂ්ඨ කරාවි. ගීත ගයන්නේ කීපයක් විතරයි.”

තරුපති මුණසිංහයන් කැළණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරයෙකි. ඔහුගේ විශයය වන්නේ ශබ්ද අධ්‍යනයයි. ඔහු මෙල්බන් විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති පර්යේෂණ උපාධියක් ලබා දැනට ඩීකින් විශ්ව විද්‍යාලයේ මානව සංගීත විද්‍යාව, මානව විද්‍යාව හා ප්‍රසාංගික කලා අධ්‍යයනයක පර්යේෂණයක් සිය ආචාර උපාධිය සඳහාම කරමින් සිටී. මෙම පර්යේෂණයේ මාතෘකාව වන්නේ “ලංකාවේ පහරට බෙරය සහ බෙරවාදාකයා” යි. මුණසිංහයන්ට ජන ගී පිළිබඳව ප්‍රබල මූලාශ්‍ර ලැබෙන්නේ වසර 2001 සිට 2007 දක්වා ගුවන් විදුලියේ ස්ථිර නිශ්පාදකවරයෙක් ලෙස රැකියාව කරන කාලයේදීයි. රෝහන බැද්දගේ කලාකරුවාණන්ගේ දියණිය, තුෂාරා ද ඔහු සමඟ එකට සේවය කළාය. කෙසේ වුවද පාසල් සමයේ මකුලොළුව සූධීන්ගේ “හෙළ ගී මඟ” ග්‍රන්ථය පරිශීලනයත්, දෙපානෝ වැනි නාට්‍යවලින් ලැබූ උනන්දුවත්, සිය පියාණන් වන ඔස්ටින් මුණසිංහයන්ගේ මියැසි කටයුතුවල තරුණ වාදකයෙකු ලෙස ලැබූ වටපිටාවත් මේ සඳහා තරුපති මුණසිංහයන් උනන්දු කරවීමට හේතුවිය.

“ඇත්තටම ළමා කාලයේදීම සහන් රන්වල, ජනනාත් වරකාගොඩ වගේ අය අපට මේ දේවල් විඳින්න ලැබුණ එක හරි වාසනාවක්. අපි ඒ රසයයි මේ අනික් අයටත් ලබා දෙන්න උත්සාහ කරන්නේ. ඉතින් අපේ මේ ප්‍රසංගයට ඇවිත් අපේ ඒ වින්දනයට හවුල් වෙන්න කියලා අපි හැමෝටම ආරාධනය කරනවා.” ඒ තරුපති මුණසිංහයන්ගේ ඇරයුමයි. අපි ගායනා සංගීත කවයටත් ඔහුටත් සුබ පැතුවෙමු.